Sri Lankan Journal of Librarianship and Information Management.
Vol 5(2). December 2013

# සම්පත් පාදක ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී සවිබලකරණය 8 තොරතුරු සාක්ෂරතා ආදර්ශයේ භාවිතය පිළිබඳ ඇගයීම

**පී. ජී. ප්‍රේමදාස**
*ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන ආයතනය*
*කොළඹ විශ්වවිද්‍යාලය*
*prem@nilis.cmb.ac.lk*

2004 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (NILIS) , යුනෙස්කෝව හා අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය (IFLA) , එක්ව සවිබලකරණය 8 නමින් නවතම තොරතුරු සාක්ෂරතා ආදර්ශයක් දකුණු හා ගිණිකොණදිග ආසියානු රටවල් සඳහා හඳුන්වා දෙන ලදි. අනතුරුව 2005 වර්ෂයේ දී එම ආදර්ශය විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යායතනය විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස එකී ආදර්ශය පාසල් පුස්තකාල අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී යොදා ගන්නා ලෙස පාසල් පුස්තකාල සංවර්ධන ඒකකයට (SLDU) දැන්වූ අතර, අනතුරුව එය පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රතිපත්තියක් ලෙසට පිළිගැනිණි.

එතැන් සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය මෙම ආදර්ශය පාසල් පුස්තකාල ක්ෂේත්‍රයට හඳුන්වා දී, ඒ යටතේ ක්‍රියාත්මක වීමට අවශ්‍ය :

1. පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම හා නවීකරණය කිරීම.
2. පුස්තකාල එකතු සංවර්ධනය හා සංවිධාන කටයුතු කිරීම.
3. ගුරු පුස්තකාලයාධිපතිවරුන් පත්කිරීම.
4. පුස්තකාල සහාය කාර්ය මණ්ඩල පත්කිරීම.
5. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
6. පුහුණුකරුවන් පුහුණු කිරීම.
7. පාසල් පුස්තකාල අධීක්ෂණය.
8. ආදර්ශ පාසල් පුස්තකාල ඉගෙනුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම්

වැනි අංග රැසක නියැලිණි. මේ සඳහා ද්විතියික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේත්, ලෝක බැංකුවේත් ආධාර ලැබුණු අතර පුහුණු කිරීම් හා අධීක්ෂණ වැඩහටහන්වල දී පර්යේෂකයා ප්‍රධාන සම්පත් දායකයා ලෙස කටයුතු කරන ලදී. මීට සමගාමීව 2004 වර්ෂයේ සිට ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය පාසල් පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ ගුරු භවතුන් ගුරු පුස්තකාලයාධිපතිවරුන් හා නිලධාරීන් සඳහා විවිධ වෘත්තිය පුහුණු පාඨමාලා හඳුන්වා දෙමින් ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව 2003 වර්ෂය අවසන් වනවිට ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 154 දෙනෙකු හදාරා ඇති අතර ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 125 දෙනෙකු හදාරා පාසල් පද්ධතියට එක්ව ඇත. උක්ත පාඨමාලාව දැ අවුරුදු සති අන්ත පාඨමාලා ලෙසත් එක් අවුරුදු පූර්ණකාලීන පාඨමාලා ලෙසත් ක්‍රියාත්මක වේ. මෙම පාඨමාලාවන්හි තොරතුරු සාක්ෂරතාව එක් විෂයයක් වන අතර අනෙක් විෂයයන් හය

1. ගුරු පුස්තකාලයාධිපතිත්වය හැඳින්වීම
2. එකතු සංවිධානය හා කළමණාකරණය
3. තොරතුරු මූලාශ්‍ර හා සේවා
4. ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

5. ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා කළමණාකරණය හා
6. පර්යේෂණ ක්‍රමවේදය වේ.

පර්යේෂකයා ඉහත සඳහන් පාඨමාලා දෙකෙහිම පාඨමාලා සමායෝජක ලෙසත්, තොරතුරු සාක්ෂරතාව හා ගුරු පුස්තකාලයාධිපතිත්වය හැඳින්වීම යන විෂයයයන් දෙකම ඉගැන්වීමේත් නිරත වේ. එසේම 2006 වර්ෂයේ සිට සවිබලකරණය 8 තොරතුරු සාක්ෂරතා ආදර්ශය භාවිතයෙන් පාසල් පුස්තකාල වැඩසටහන් හා ඊට අදාළ අධ්‍යයන ව්‍යවහාර වැඩසටහන් මෙහෙයවීමෙහි හා අධීක්ෂණයෙහි නියැලී සිටී.

ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ විධිමත් වෘත්තීය පුහුණුවක් ලබා පාසල් පද්ධතියට එක් වූ මෙම පිරිස ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයන්වලදී තොරතුරු සාක්ෂරතාව විෂයය යටතේ හඳුන්වා දෙන ලද සවිබලකරණය 8 තොරතුරු සාක්ෂරතා ආදර්ශය අනුව වැඩසටහන් ක්‍රියාත්මක කරන බව පසු කාලීනව පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය හා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය එක්ව ක්‍රියාත්මක කළ විවිධ පුහුණු හා අධීක්ෂණ වැඩසටහන්වල දී අනාවරණය කර ගැනීමට හැකි වුණි. තවද, මෙම පාඨමාලාවන් හැදෑරුවන්ගෙන් සමහරෙක් තොරතුරු සාක්ෂරතාව විෂය තේමා කර ගනිමින් තම පර්යේෂණ නිබන්ධන සම්පූර්ණ කර ඇත. එහෙත් එම ආදර්ශය හඳුන්වා දී මේ වන විට වර්ෂ වර්ෂ 07 ක් පමණ ගත වී ඇතත් ඒ පිළිබඳ විධිමත් අධ්‍යයනයක් ජාතික මට්ටමින් පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක නොවුණි. එහෙයින් සම්පත් පාදක ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සවිබලකරණය 8 තොරතුරු සාක්ෂරතා ආදර්ශයේ භාවිතය පිළිබඳ විධිමත් ප්‍රගති සමාලෝචනයක අවශ්‍යතාව මතුව ඇති අතර එය විධිමත් වෘත්තීය පුහුණුවක් ලද මෙම පිරිස ඇසුරින් ක්‍රියාත්මක කිරීම මගින් ඌනපූර්ණය වේ යැයි අපේක්ෂා කරමි.

**සාහිත්‍ය විමසුම**

සම්පත් පාදක ඉගැන්වීම්වලට අදාළව ගුරුවරුන්ගේ සහභාගිත්වය පිළිබඳව ලෝස්වර් (2000) පහත සඳහන් වර්ගීකරණය ඉදිරිපත් කර ඇත.

1. ඉගැන්වීම් සඳහා පුස්තකාල ද්‍රව්‍ය භාවිතයට නොගනී.
2. පුස්තකාලයට පැමිණීම කලාතුරකින් සිදුවේ.
3. පංති කාමර ඉගෙනුම සඳහා පුස්තකාලයෙන් තොරතුරු සම්පත් රැගෙන යයි.
4. එසේ තොරතුරු සම්පත් රැගෙන යාමේදී ගුරු/පාසල් පුස්තකාලයාධිපති ඊට අදාළ උපදෙස් හා යෝජනා ඉදිරිපත් කරයි.
5. අතිරේක කියවීම සඳහා ළමුන් පුස්තකාලය වෙත යොමු වෙයි.
6. පාඩම් ඒකකවලට අදාළ ඉගැන්වීමේදී පුස්තකාලය සම්බන්ධ කර ගෙන කටයුතු කරයි.
7. ඊට අමතරව තොරතුරු කුසලතා වැඩසටහන් ගුරු/පාසල් පුස්තකාලයාධිපති හා එක්ව ක්‍රියාත්මක කරයි.
8. පාඩම් ඉගැන්වීමට ප්‍රථම ගුරු/පාසල් පුස්තකාලයාධිපති හා එක්ව පාඩම් ඉගැන්වීම් පිළිබඳ සැලසුම් කර අනතුරුව දෙදෙනාම එක්ව පාඩම් ඉගැන්වීම් හා ඇගයීම් කටයුතුවල නිරත වේ.

ඉහත වර්ගීකරණය අනුව අංක 1 මට්ටම සම්පත් පාදක ඉගැන්වීමේ පහළ හෙවත් දුර්වලම අවස්ථාව නිරූපණය කරන අතර අංක 8 මට්ටම ප්‍රශස්ත හෙවත් ඉහළම අවස්ථාව නිරූපණය කෙරේ. තවද, විෂයභාර ගුරුවරයා හා ගුරු/පාසල් පුස්තකාලයාධිපති අතර පවතින අන්තර් සබඳතාවත්, විදුහල්පතිගේ කළමණාකරණ භූමිකාවත් සම්පත් පාදක ඉගැන්වීම කෙරෙහි ඍජු බලපෑමක් ඇති කරයි.

සම්පත් පාදක ඉගැන්වීම කෙරෙහි ඉහත සඳහන් කරන ලද අන්තර් සබඳතාව පිළිබඳ මොන්ටයිල් (2005) දක්වන න්‍යායාත්මක පසුබිම ආකෘති 04 ක් මගින් විදහා දැක්වේ.

**සම්බන්ධීකරණ ආකෘතිය**

මෙහිදී ගුරුවරයා හා ගුරු/පාසල් පුස්තකාලයාධිපති වෙන වෙනම පාඩම් සැලසුම් හා විෂය සමගාමී ක්‍රියාකාරකම් සැලසුම් කරනු ලබන අතර ක්‍රියාවට නැංවීම එකවිට සිදුවේ. මෙම ස්වභාවය ලෝස්වර් වර්ගීකරණයේ 2-4 මට්ටම්වල හැසිරීම මඟින් නිරූපණය වේ.

**සහභාගීත්ව ආකෘතිය**

ගුරුවරයා හා පුස්තකාලයාධිපති වෙන් වෙන්ව පාඩම්වලට අදාළ අරමුණු, අභිමතාර්ථ ඇතිව වැඩසටහන් සැලසුම් කළද එකට එක්ව ක්‍රියාත්මක කිරීමක් සිදුවේ. මෙම තත්වය ඉහත වර්ගීකරණයේ 5-6 මට්ටම් අතර හැසිරීමක් විදහා දක්වයි.

**සමෝධානිත උපදේශන ආකෘතිය**

පාඩම් සැලසුම් කිරීම හා ඉගැන්වීම දෙදෙනා එක්ව සිදු කෙරේ. ලෝස්වර් වර්ගීකරණයේ 7 වන මට්ටම මීට අදාළ වේ.

**සමෝධානිත විෂය මාලා ආකෘතිය**

විදුහල්පතිගේ නායකත්වය හා මග පෙන්වීම මත ගුරුවරයා හා ගුරු පුස්තකාලයාධිපති එක්ව අභ්‍යන්තර විෂය මාලා සැලසුම්කරණය සිදුකර එමගින් ඉගැන්වීම හා ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කෙරේ. මෙය සම්පත්පාදක ඉගැන්වීමේ ප්‍රශස්ත මට්ටම හෙවත් 8 වන අදියර නිරූපණය කරයි.

ලෝස්වර් වර්ගීකරණයත්, මොන්ටයිල් ආකෘතියෙනුත් සම්පත් පාදක ඉගැන්වීමට අදාළ අධ්‍යාපනික ප්‍රවේශයක් පාසල් පද්ධතිය තුළට හඳුන්වා දී ඇත. මෙම අධ්‍යාපනික හෙවත් න්‍යායාත්මක ප්‍රවේශය ක්‍රියාවට නැංවීම සඳහා ඊට සමාන්තරව ක්‍රියාත්මක වන ප්‍රායෝගික ප්‍රවේශයක් පුස්තකාල හා තොරතුරු විද්‍යාව මගින් ඉදිරිපත් කෙරේ. එය තොරතුරු විද්‍යාත්මක ප්‍රවේශයක් වන අතර 2005 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියට සවිබලකරණය 8 නමින් තොරතුරු සාක්ෂරතා ආදර්ශයක් ඒ සඳහා හඳුන්වා දී ඇත. (Brown, 2005)

සවිබලකරණය 8 තොරතුරු සාක්ෂරතා ආදර්ශය පියවර 8 කින් සමන්විත වන අතර ඒ පියවර තුළදී භාවිතයට ගැනෙන තොරතුරු කුසලතා ප්‍රවේශ 05 ක් පවතී. පහතින් දක්වා ඇත්තේ එහි පියවර හා තොරතුරු කුසලතා ප්‍රවේශයන්ය.

| **සවිබලකරණය 8 හි පියවර** | **තොරතුරු කුසලතා** |
|---|---|
| 1. ගැටලුව හඳුනා ගැනීම | 01.විශ්ලේෂණ කුසලතා |
| 2. තොරතුරු ගවේෂණය | 02. ගවේෂණ කුසලතා |
| 3. තොරතුරු තෝරා ගැනීම<br>4. තොරතුරු සංවිධානය<br>5. නිර්මාණය<br>6. ඉදිරිපත් කිරීම | 03.අවබෝධාත්මක කුසලතා |
| 6. ඉදිරිපත් කිරීම | 04.ඉදිරිපත් කිරීමේ කුසලතා |
| 7. ඇගැයීම | 05. ඇගැයීමේ කුසලතා |
| 8. නව අවස්ථාවන්ට භාවිතය | |

එහෙයින් පසුගිය වසර තුන තුළ ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යායතනයේ ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හැදෑරූ ගුරු හා පාසල් පුස්තකාලයාධිපතිවරුන් යොදා ගනිමින් සම්පත් පාදක ඉගෙනුම් සඳහා සවිබලකරණය 8 තොරතුරු සාක්‍ෂරතා ආදර්ශය යොදා ගන්නා ලද ආකාරය ඇගැයීමකට භාජනය කිරීම මෙම පර්යේෂණය මගින් සිදු කෙරේ.

**අධ්‍යයනයේ අරමුණු**

මෙම අධ්‍යයනය මගින් පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමක් අපේක්‍ෂා කෙරේ.

1. නියැදියේ පාසල් පුස්තකාලයන් හි එකතු සංවර්ධනය හා සංවිධානයේ ස්වරූපය විශ්ලේෂණය.
2. සම්පත් පාදක ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වීමේ දී එහි කුමන අදියරයන්හි ක්‍රියාත්මක වේ දැයි යන්න අනාවරණය.
3. එකී අදියරයන් තුළ සවිබලකරණය 8 තොරතුරු සාක්ෂරතා ආදර්ශයේ භාවිතය කවර මට්ටමකින් ද යන්න විමර්ශනය.
4. සවිබලකරණය 8 තොරතුරු සාක්ෂරතා ආදර්ශය භාවිතයේදී ගුරු මණ්ඩලයේ දායකත්ව ස්වරූපය අධ්‍යයනය.
5. නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම.

**ක්‍රමවේදය**

2005 වර්ෂයේ සිට සවිබලකරණය 8 තොරතුරු සාක්ෂරතා ආදර්ශය ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවන්ට හඳුන්වා දුන්න ද ඒ සඳහා අන්තර්ජාතික මට්ටමින් පසුවිපරම් සම්මන්ත්‍රණ 2006, 2007 වර්ෂවල දී සිදු කරන ලද හෙයින් එම අත්දැකීම් පාදක කර ගනිමින් 2008 වර්ෂයේ සිට වඩා විධිමත්ව මෙම තොරතුරු සාක්ෂරතා ආදර්ශය උක්ත පාඨමාලාවන්ට හඳුන්වා දෙන ලදි. එහෙයින් අහඹු නොවන සහේතුක නියැදි ක්‍රමයට අනුව 2008 අධ්‍යයන වර්ෂයේ සිට මේ දක්වා ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හැදෑරූ ගුරු හා ගුරු පුස්තකාලයාධිපතිවරුන් විසිපස් දෙනා (25) නියැදියට ඇතුළත් කර ගැණිනි. එම පිරිස ඊට ප්‍රථම පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ලබා තිබීමත්, ගුරු සේවයේ දීර්ඝ කාලයක් නියැලී සිටීමත් මෙයට හේතු වේ.
ඒ අනුව නියැදියට අයත් ගුරු හා ගුරු පුස්තකාලයාධිපති පිරිස සාමූහික ත්තොයක අධ්‍යයන ශිල්ප ක්‍රමයට ඔවුන්ගේ රාජකාරී කටයුතුවල දී සිදු කරන විධිමත් විෂය මාලාවේ පාසල් පුස්තකාල වැඩසටහන්, විෂය සමගාමී ක්‍රියාකාරකම්, ගුරුවරුන්ගේ ඉගැන්වීම් කාර්යයේ දී ගුරුවරයා හා ඔවුන් අතර පැවති සම්බන්ධතාව, විෂය මාලාව සැලසුම් කිරීම, සමස්ථ කාර්ය සඳහා විදුහල්පතිගේ කළමණාකරණ භූමිකාව අධ්‍යයනයට හසු කෙර. එහි දී ප්‍රශ්නාවලි, කේවල සම්මුඛ සාකච්ඡා, නාභිගත කණ්ඩායම් සාකච්ඡා, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අධීක්‍ෂණය හා ලිඛිත මූලාශ්‍ර මගින් දත්ත එක්රැස් කෙරුණි. ඒ අනුව ගුණාත්මක දත්ත විශ්ලේෂණය ක්‍රම ශිල්පවලට අනුව දත්ත අඩු කිරීම්, දත්ත ප්‍රදර්ශනය කර ගැනීම හා ඒවා තහවුරු කර ගැනීමත් සිදු කළ අතර සන්ධාරණ විශ්ලේෂණ ක්‍රම ශිල්පයද භාවිතය ගැනුණි.

**දත්ත විශ්ලේෂණය**

**ප්‍රශ්නාවලියට අදාළ දත්ත විශ්ලේෂණය**

නියැදිය සඳහා ගුරු හා පුස්තකාලයාධිපතිවරුන් 25 දෙනෙකු තෝරා ගත් අතර ඔවුන්ට යොමු කරන ලද ප්‍රශ්නාවලිය සඳහා 20 දෙනෙකු පිළිතුරු එවා තිබුණි. මෙම පිරිස පුස්තකාලය භාරව කටයුතු කිරීම,

පුස්තකාලය භාරව කටයුතු කරන අතර ඉගැන්වීමේ නිරත වීම හා ඉගැන්වීමේ පමණක් නිරත වන ආකාරය පහත ආකාර වේ.

වගුව 01

| නියැදිය ස්වභාවය | පුස්තකාලය පමණක් භාරව කටයුතු කිරීම | පුස්තකාලය භාරව කටයුතු කරන අතර ඉගැන්වීමේ නිරත වීම | ඉගැන්වීමේ පමණක් නිරත වීම |
|---|---|---|---|
| ගුරුවරු සංඛ්‍යාව 09 | 02 | 04 | 03 |
| ගුරු පුස්තකාලයාධිපතිවරු 11 | 02 | 06 | 03 |

පුස්තකාලය භාරව පමණක් කටයුතු කරන පිරිස 04 දෙනෙකු නිසා ඔවුන් ඉගැන්වීමේ කාර්යයේ නිරත නොවන හෙයින් සම්පත් පාදක ඉගැන්වීම සඳහා සවිබලකරණය 8 ආදර්ශය භාවිතයට අදාළ ක්‍රියාකාරකම් ඔවුන් විසින් සිදු නොකෙරේ. එහෙත් පුස්තකාලය භාරව කටයුතු කරන හෙයින් ඉගැන්වීමේ නිරත වන ගුරුභවතුන්ගේ සම්පත් පාදක ඉගැන්වීමට පුස්තකාලයාධිපති ලෙස ඔවුන් දක්වන දායකත්වය කවර ආකාරද යන්න විග්‍රහ කළ යුතුව ඇත.
ඒ අනුව ලෝස්වර් වර්ගීකරණය තුළ ඔවුන්ගේ දායකත්වය පවතින මට්ටම මෙසේය.

වගුව 02

| මට්ටම | නිරත වන සංඛ්‍යාව |
|---|---|
| 01. පුස්තකාලය භාවිත නොකරයි | - |
| 02. පුස්තකාලයට පැමිණීම කලාතුරකිනි | - |
| 03. පුස්තකාල තොරතුරු සම්පත් පංති කාමරවලට රැගෙන යති. | - |
| 04. එහිදී ගුරු පුස්තකාලයාධිපති උපදෙස් ලබා දේ | 01 |
| 05. අතිරේක කියවීමට ළමුන් යොමු කළවිට අදාළ මග පෙන්වීම කරති. | - |
| 06. පාඩම්වලට අදාළව පුස්තකාලය සම්බන්ධ කරගෙන කටයුතු කරති | 02 |
| 07. ගුරුවරයා හා එක්ව තොරතුරු කුසලතා උගන්වති | 01 |
| 08. ගුරුවරයා හා එක්ව පාඩම් සැලසුම් කර ඉගැන්වීමේ හා ඇගැයීමේ නිරත වේ | - |

එහෙයින් පුස්තකාලය භාරව පමණක් කටයුතු කරන සිවුදෙනා සම්පත් පාදක ඉගැන්වීමට අදාළ මොන්ටයිල් ආකෘතිවලට අනුව සම්බන්ධීකරණ ආකෘතියේ (01) එක් අයෙකුද සහභාගීත්ව ආකෘතියේ (02) දෙදෙනෙකුද සමෝධානිත විෂය මාලා ආකෘතියේ (01) එක් අයෙකුද ලෙස කටයුතු කරනු ලැබේ.

පුස්තකාලය භාරව සිටිමින් ඉගැන්වීමේ නිරත වන හා ඉගැන්වීමේ පමණක් නිරත වන පිරිස 16 දෙනෙකු වු අතර ඔවුන්ගේ සම්පත් පාදක ඉගැන්වීමේ ස්වභාවය ඉහත වර්ගීකරණයේ මට්ටම්වලට අනුව පහත ආකාර විය.

වගුව 03

| මට්ටම | පුස්තකාලය භාරව සිටිමින් ඉගැන්වීමේ නිරත වන පිරිස 10 | ඉගැන්වීමේ පමණක් නිරත වන පිරිස 06 |
|---|---|---|
| 01. පුස්තකාලය භාවිත නොකරයි | - | - |
| 02. පුස්තකාලයට පැමිණීම කලාතුරකිනි | - | - |
| 03. පුස්තකාල තොරතුරු පමණක් පංති කාමරවලට රැගෙන යති | 03 | 01 |
| 04. ඊට අදාළ උපදෙස් ලබා දේ | - | - |
| 05. අතිරේක කියවීමට ළමුන් යොමු කරති | 02 | 03 |
| 06. පාඩම්වලට අදාළව පුස්තකාලය සම්බන්ධ කරගෙන කටයුතු කරති | 02 | 01 |
| 07. තොරතුරු කුසලතා උගන්වති | 02 | 01 |
| 08. ගුරුවරයා/ ගුරු පුස්තකාලයාධිපති එක්ව පාඩම් සැලසුම, ඉගැන්වීම හා ඇගැයීම සිදු කරති | 01 | - |

ඉහත විශ්ලේෂණ දත්තවලට අනුව පුස්තකාලය භාරව සිටිමින් ඉගැන්වීමේ නිරත වන පිරිස 10 දෙනෙකු  වන අතර එම පිරිස මොන්ටයිල් ආකෘතිය අනුව ක්‍රියාත්මක වන ආකාරය ගත් විට සම්බන්ධීකරණ ආකෘතියේ තිදෙනෙකුද සහභාගීත්ව ආකෘතියේ සිවු දෙනෙකුද සමෝධානිත උපදේශන ආකෘතියේ දෙදෙනෙකුද ප්‍රශස්ත මට්ටමට අදාළ සමෝධානිත විෂය මාලා ආකෘතියේ එක් අයෙකුද ක්‍රියාත්මක වේ.

ඉගැන්වීමේ පමණක් නිරත වන පිරිසගේ දායකත්වය සැලකූ විට සම්බන්ධීකරණ ආකෘතියේ එක් අයෙකුද, සහභාගීත්වය ආකෘතියේ 04 දෙනෙකුද, සමෝධානිත උපදේශන ආකෘතියේ එක් අයෙකුද කටයුතු කරති.

ඉහත ආකාරයට සම්පත් පාදක ඉගැන්වීමේ විවිධ මට්ටම්වලින් නිරත වන ගුරු හා ගුරු පුස්තකාලයාධිපතිවරුන් ඒ සඳහා අවශ්‍ය වන තොරතුරු විද්‍යාත්මක ප්‍රවේශය ලෙස සවිබලකරණය 8 ආදර්ශය භාවිතයට ගැනීමේදී ක්‍රියාත්මක වී ඇති ආකාරය පහත සටහනින් දැක්වේ.

වගුව 04

| සව්බලකරණ 8 අදියර | පුස්තකාලය පමණක් භාරව | | | | | පුස්තකාලය භාරව හා ඉගැන්වීම සිදුකරන | | | | | | | | | | ඉගැන්වීම පමණක් සිදුකරන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 | 19 | 20 |
| ගැටලුව හඳුනා ගැනීම | | | | | ✓ | | | | ✓ | | | | | | | | | | | |
| තොරතුරු ගවේෂණය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| තොරතුරු තෝරා ගැනීම | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| තොරතුරු සංවිධානය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| නිර්මාණය | | | | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | | | | |
| ඉදිරිපත් කිරීම | | | | | ✓ | | | ✓ | ✓ | ✓ | | | | ✓ | | | | ✓ | | |
| ඇගැයීම | | | | | ✓ | | | ✓ | ✓ | | | | | | | | | ✓ | | |
| නව අවස්ථාවට භාවිතය | | | | | | | | | | | | | | | | | | | | |

මේ අනුව නියැදියේ 20 දෙනාගෙන් 5 දෙනෙකු සව්බලකරණ 8 ආදර්ශය අනුව පාඩම් ක්‍රියාත්මක කර ඇති බවත් ඉතිරි 15 දෙනා එම ආදර්ශයේ 2, 3 හා 4 වන අදියරයන් වන තොරතුරු ගවේෂණය, තොරතුරු තෝරා ගැනීම හා තොරතුරු සංවිධානය සඳහා මූලික වී කටයුතු කරන බවක් නිරූපණය වේ.

**ක්ෂේත්‍ර අධ්‍යයනයට අදාළ දත්ත විශ්ලේෂණය**

ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා ගුරුවරුන් හා ගුරු පුස්තකාලයාධිපතිවරුන් ඇතුළත් වන අයුරින්ද උතුරුමැද, සබරගමුව, ඌව හා බස්නාහිර පළාත් නියෝජනය වන අයුරින්ද, 1C වර්ගයේ පාසල් 3 ක්ද, 2 වර්ගයේ පාසලක්ද තෝරා ගැනුණි. එහිදී එක් දිනක් එක් පාසලක් වෙනුවෙන් වෙන් කළ අතර පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත විය.

1. ළමුන්ගේ පුස්තකාල භාවිතය නිරීක්ෂණය හා ඉන් සිසුන් දෙදෙනෙකු සමග සාකච්ඡා කිරීම.
2. පංති කාමර ඉගැන්වීම් නිරීක්ෂණය.
3. ගුරු භවතුන්ගේ පාඩමක් අධීක්ෂණය හා පසු සාකච්ඡාව.
4. විදුහල්පති හා ගුරු මණ්ඩලය සමග වැඩසටහන් සමාලෝචන රැස්වීම

පාසල් 04 A, B, C හා D ලෙස නම් කරගත් අතර :A පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව 400 ක් විය. ගුරු පුස්තකාලයාධිපතිවරිය පුස්තකාලය භාරව පමණක් කටයුතු කරන අතර කියවීම් ප්‍රවර්ධනය පිළිබඳ වැඩි උනන්දුවකින් කටයුතු කර තිබුණි. තව ද  එම පාසලේම වෙනත් ගුරුවරියක් කියවීම් ක්‍රියාකාරකමට අදාළ පාඩමක් සිදු කරන ලදි. සව්බලකරණය 8 ආදර්ශයට අනුව එම පාඩම් ක්‍රියාත්මක කර තිබූ අතර ඒවායේ සාර්ථකභාවයද ඉහළ මට්ටමක පැවතුණි. සව්බලකරණය 8 පිළිබඳව පොදුවේ විදුහල්පති හා ගුරු මණ්ඩලය දැනුවත්ව නොතිබුණු අතර එම කලාපයේ පුස්තකාල විෂය භාර සහකාර අධ්‍යක්ෂවරියද පාඩම නිරීක්ෂණය කළ අතර ඇයද මෙම ආකෘතිය පිළිබඳ දැනුවත් නොවී තිබුණි.

B පාසලෙහි ශිෂ්‍ය සංඛ්‍යාව 800 ක් වූ අතර පුස්තකාල එකතු සංවර්ධනය හා සංවිධානය සාර්ථක මට්ටමින් සිදු කර තිබුණි. ගුරු පුස්තකාලයාධිපතිවරිය ඉගැන්වීමේ කටයුතුවලද පුස්තකාලය භාරවද කටයුතු කරන අතර සවිබලකරණයේ 8 ආදර්ශයේ තොරතුරු ගවේෂණය, තොරතුරු තෝරා ගැනීම හා සංවිධානය වැනි අදියරවල නිරතවී තිබුණි. ගුරු මණ්ඩලය හා විදුහල්පති සවිබලකරණය 8 ආදර්ශය පිළිබඳ අවබෝධයක් ලබා නොතිබුණි.

C හා D පාසල්වල ළමුන් පිළිවෙළින් 116 ක් හා 194 ක් වූ අතර එම පාසල් දෙකෙහි ඉගෙනුම් ක්‍රියාවලියට අදාළ සම්පත් ප්‍රමාණවත් මට්ටමක තිබු නමුත් ඒවායේ භාවිතය මධ්‍යස්ථ මට්ටමක පවතින බව පංති කාමර පාඩම් නිරීක්ෂණයේදී අනාවරණය විය. එම පාසල් දෙකෙහිම එක් පාසලක එක් ගුරුවරයෙකුගේ පාඩමක් බැගින් අධීක්ෂණය කිරීමට අවස්ථාව ලද අතර එම පාඩම් සාම්ප්‍රදායික දේශන සාකච්ඡා ක්‍රමයටම පැවති අතර සම්පත් පාදක ඉගැන්වීමේදී ලෝස්වර් වර්ගීකරණය පහළ මට්ටමක ක්‍රියාත්මක වීම පැවතුණි. විදුහල්පති හා ගුරු මණ්ඩලයද සවිබලකරණය 8 ආදර්ශය පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

**කේවල හා නාභිගත සම්මුඛ සාකච්ඡාවලට අදාළ දත්ත විශ්ලේෂණය**

කේවල සම්මුඛ සාකච්ඡා සඳහා නියැදියෙන් දස දෙනෙකු සහභාගි කරගත් අතර ඉතිරි දස දෙනා කාණ්ඩ 2 ක් වශයෙන් වෙන් කරගෙන නාභිගත සම්මුඛ සාකච්ඡාවන් පවත්වන ලදි. නිළධාරීන්ට අදාළ කේවල සම්මුඛ සාකච්ඡාව සඳහා පාසල් පුස්තකාල සංවර්ධන ඒකකයේ නිළධාරීන් දෙදෙනෙකු ද, පුස්තකාල විෂය සම්බන්ධ පළාත් සම්බන්ධීකරණ නිළධාරීන් හතර දෙනෙකු හා කලාප අධ්‍යාපන කාර්යාලවලට අදාළව පුස්තකාල විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු තෝරා ගෙන සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි.

***නිළධාරීන්ට අදාළ සම්මුඛ සාකච්ඡාවල දී පහත සඳහන් අදහස් ඉදිරිපත් කරන ලදි.***

"කලින් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ තිබූ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය මෙම වර්ෂයේ ආරම්භයේ සිට නව අමාත්‍යාංශයක් වන අධ්‍යාපන සේවා අමාත්‍යාංශයට අයත් වූ නිසා අදාළ ඉදිරි සැලසුම් මේ දිනවල සකස් වන හෙයින් මීට ප්‍රථම ක්‍රියාත්මක කළ පුස්තකාල වැඩසටහන් ඉදිරියට කරගෙන යාම තාවකාලිකව ප්‍රමාදයකට ලක්ව ඇත."

"පළාත් මට්ටමින් සිදු කරන පුස්තකාල පුහුණු වැඩසටහන් ප්‍රධාන වශයෙන් පාසල්හි 2 වන වාරය අවසානයේ හා 3 වන වාරය සිදු කරනු ලබන අතර (මුල්‍ය ප්‍රතිපාදන ලැබීම මත) එහිදී සවිබලකරණය 8 ආදර්ශයට අනුව පුහුණුවීම් ලබා දීමට සිදුවන අවස්ථා සීමිතය. එයට හේතුව ඒ පිළිබඳ විශේෂඥ දැනුමක් ලත් පිරිස සීමිත හෙයින් ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යායතනයේ සම්පත් දායකත්වය මත පමණක්ම යැපීමට සිදු වීමයි."

"පසුගිය අවුරුදු තුනක පමණ කාලයක සිට අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉහළ නිළධාරීන් සඳහා සවිබලකරණය 8 පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටහනක් ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනයේ සම්පත් දායකයන් ලවා ක්‍රියාත්මක කර ගැනීමට ඉඩ ප්‍රස්ථාවක් නොලැබුණි".

***නියැදියේ ගුරු පුස්තකාලයාධිපති හා ගුරුවරුන්ට අදාළ සම්මුඛ සාකච්ඡාවලදී ප්‍රධාන වශයෙන් දක්වන ලද අදහස් පහතින් දැක්වේ.***

"සවිබලකරණය 8 ආදර්ශය පිළිබඳ විදුහල්පති හා ගුරු මණ්ඩල දැනුවත් කිරීම පළාත් හා කලාප මට්ටමින් සිදු කිරීම, අප විසින් පාසල තුළින් ඒ පිළිබඳ දැනුවත්භාවයක් ලබාදෙනවාට වඩා විධිමත් යයි සිතේ."

"පාසල් පුස්තකාලය ආශ්‍රිතව, ගැටලු පාදක, ව්‍යාපෘති පාදක, විමසුම් පාදක, අන්තර්ජාල පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම් විනාඩි 40 ක් හෝ 80 ක් වැනි කාලසීමාවක් රැගෙන ක්‍රියාත්මක කිරීම අසාර්ථක වන අතර සම්පත් හා කාලය අපතේ නොයන අයුරු ක්‍රියාකාරකම්වල නිරත වීමට නම්‍යශීලි කාලසටහනක් අවශ්‍ය වන අතර ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් ඉහළ මට්ටමින් නිර්දේශ විය යුතුය."

"ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි හා ශාස්ත්‍රපති පාඨමාලා ගුරු සේවයේ උසස් වීම් වලට පිළිනොගන්නා නිසා පද්ධතිය තුළ අපහට අඩු සැලැකිල්ලක් දැක්වීම අපගේ රාජකාරී කටයුතු වලට බලපෑමක් එල්ල කර ඇත."

මෙම අදහස් විශ්ලේෂණය කළ විට දක්නට ලැබෙන ප්‍රධාන සාධක වනුයේ පාසල් පද්ධතිය තුළ සවිබලකරණය 8 ආදර්ශය භාවිත කිරීම පිළිබඳ ජාතික මට්ටමින් විධිමත් අඛණ්ඩ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වීම මඟහැරී ඇති අතර විදුහල්පතිගේ භූමිකාව සවිබලකරණය 8 ක්‍රියාත්මක වීම කෙරෙහි ඍජුවම බලපෑවද ඒ පිළිබඳ ඔවුන් නිසි ලෙස දැනුවත් වී නොමැති වීමය.

**නිගමන හා යෝජනා**

සවිබලකරණය 8 ආදර්ශය භාවිත කරමින් සම්පත් පාදක ඉගැන්වීමේ නිරත වීම වඩාත් පහසුවනුයේ පුස්තකාලය භාරව සිටීමට අමතරව පන්ති කාමර ඉගැන්වීමෙහි නිරතවී සිටීමෙන් බව විශ්ලේෂිත දත්ත තහවුරු කරයි. පුස්තකාලය පමණක් භාරව සිටීමෙන් ඉගැන්වීමට අවස්ථාවක් නොලැබෙන හෙයින් ගුරුවරුන්ගේ සම්පත් පාදක ඉගැන්වීමට දායකවීම පමණක් සිදුවේ. එහෙත් ගුරු මණ්ඩලය සවිබලකරණය 8 පිළිබඳ දැනුවත්වී නොමැති බැවින් සම්පත් පාදක ඉගැන්වීම සඳහා සක්‍රිය දායකත්වයක් නොලැබෙන බව පැහැදිලිය. ඒ අනුව ඔවුහු සවිබලකරණය 8 ආදර්ශයේ සමහර පියවරවලට අදාළ තොරතුරු කුසලතා ඉගැන්වීමට පමණක් සීමාවෙති. පුස්තකාලය භාර නොවී ඉගැන්වීමේ පමණක් නිරත වනවිට පුස්තකාල කළමණාකරණය සඳහා දායකත්වය නොලැබී යාම හේතුවෙන් ඔවුනගේ ඉගැන්වීම කෙරෙහි පුස්තකාලයේ සම්බන්ධතාව දුරස්ව ඇති බව තහවුරු වේ. එහෙයින් ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ලබා ඇති වෘත්තීය පුහුණුව නිසි ලෙස භාවිතයට ගැනීම සඳහා ඔවුනට පුස්තකාලය භාර දීමට කටයුතු කර, සතියකට කාලච්ඡේද 10 ක් (චක්‍රලේඛයට අනුව) පන්ති කාමර තුල ඉගැන්වීම සඳහා වෙන් කිරීම ඵලදායි භාවිතයක් වනු ඇත.

නියැදියට අයත්වූ 20 දෙනාගෙන් සවිබලකරණය 8 හි පළමු අදියර වන ගැටලුව හඳුනා ගැනීම අදියෙරෙහි නිරතවී ඇත්තේ දෙදෙනෙකු පමණි. එයට හේතුව එම අදියර තුළදී කළයුතු ක්‍රියාකාරකම් පිළිබඳ සිසුනට අවබෝධයක් නොමැතිවීමය. මෙහිදී ගැටලුව හඳුනා ගැනීම සඳහා සංකල්ප සිතියම්, මනස් සිතියම් හා ප්‍රශ්නකරණ වැනි තොරතුරු කුසලතා පිළිබඳ මනා අවබෝධයක් අවශ්‍යය. එම කාර්යය පන්ති කාමර ඉගැන්වීම තුළ ගුරුවරයා විසින් සිදුකරනු ලබන්නේ නම් ගුරු පුස්තකාලයාධිපතිට පුස්තකාලය තුළදී සවිබලකරණය 8 හි ඊළඟ අදියරෙහි සිට අදාළ වැඩ මාලාව ක්‍රියාත්මක කිරීම පහසු වනු ඇත. සවිබලකරණය 8 අදියරෙහි අවසන් අදියර වන "නව අවස්ථාවට භාවිතය" ද නියැදියේ කිසිවෙකු විසින් ක්‍රියාත්මක කොට නොමැත. මෙම අදියර පුද්ගල සවිබලකරණයේ අභ්‍යන්තරික ගති ලක්ෂණයක් වන හෙයින් බාහිර මිනුමකට හසුකර ගැනීම ඍජු

ලෙස සිදු කර ගත නොහැක. එහෙයින් සවිබලකරණ 8 ආදර්ශයේ පියවර පිළිබඳවද නව කතිකාවක අවශ්‍යතාවක් පැන නඟී.

සවිබලකරණය 8 ට අදාළ ක්‍රියාකාරකම්වල නිරත වීම සඳහා සති 02 ක් හෝ 03 ක් පමණ කාලයක් වැයවන, කඩින් කඩ ක්‍රියාත්මක වීමට හැකි පංති කාමර කාලසටහනක් අවශ්‍ය වන බව නිරූපිත දත්ත පෙන්නුම් කරයි. එහෙයින් මෙම ආදර්ශය ක්‍රියාත්මක කිරීම වඩාත් පහසු වනුයේ පංති කාමර ඉගැන්වීමේදීට වඩා ඉගෙනුම් දිගුව හෙවත් ස්වාධීන ඉගෙනුම් අවස්ථාවේදීය. එහෙයින් ඉගෙනුම් දිගුවට අදාළව ගුරු අත්පොත්වල සඳහන් ඉගෙනුම් උපකරණ තැනීමේ ක්‍රියාකාරකම්වලදී මෙම ආකෘතිය භාවිතයට ගතහැකි ආකාරය පිළිබඳ විදුහල්පති හා ගුරු මණ්ඩල දැනුවත් කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවීම කාලෝචිත වේ. ගුරු මණ්ඩල හා විදුහල්පති දැනුවත් කිරීමට ප්‍රබල බාධකයක් වී ඇත්තේ ඒ පිළිබඳ විශේෂඥ දැනුම ඇති පිරිස අල්ප වීම බව විශ්ලේෂිත දත්ත පෙන්නුම් කරයි. එහෙයින් ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි හා ශාස්ත්‍රපති උපාධි හැදෑරූ පිරිස හඳුනාගෙන අධ්‍යාපන කලාප හා පළාත් මට්ටමින් පුහුණුකරුවන් සංචිතයක් ආරම්භකර ඒ ඇසුරින් විදුහල්පති හා ගුරු මණ්ඩල පිළිබඳ විධිමත් පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කළ හැකිවනු ඇත.

පාසල් පුස්තකාල සංවර්ධන ඒකකය, සවිබලකරණය 8 ආදර්ශය ක්‍රියාත්මක කිරීමට අදාළ නව කතිකාවක් සැලසුම් කර ඒ ඇසුරින් නව වැඩ පිළිවෙළක් පාසල් පද්ධතියට හඳුන්වාදීම කාලෝචිත වන අතර අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු තුළ ඒ පිළිබඳ විධිමත් තිරස් හා සිරස් සන්නිවේදන වැඩ මාලාවක් හඳුන්වා දීම මෙම ආකෘතිය පාසල් පද්ධතිය තුළ ස්ථාපිත කිරීමට මනා පිටුබලයක් ලබාදෙනු ඇත.

**ආශ්‍රිත මූලාශ්‍ර**

Brown, G. Bowden, R. & Wijethunge, P. (2005). *Launching of the Information Skill for Learning*. Conference Proceeding. Sri Lanka : Ministry of Education.

Loertscher, D.V. (2000). *Taxonomies of the school library media program.* (2nd ed.). San Jose, CA: Hi Willow Research and Publishing.

Montiel-Overall, Patricia. (2005). *A Theoretical Understanding of Teacher and Librarian Collaboration (TLC).* School Libraries Worldwide .11 (2), 24 - 48